# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION

සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ
Po.Box No — 10120

ෆැක්ස්
தொலைநகல
Fax — 011-2171635

දුරකථන
தொலைபேசி
Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site — www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail — dir.media@police.gov.lk


මගේ අංකය
எனது இலக்கம்
My NO — 2025/ 2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No — / 2024

දිනය
திக
Date — 25/07/2024
පැය 1425

## මාධ්‍ය නිවේදනය

### කබුළුමුල්ල රජමහා පත්තිණි දේවාලයේ වාර්ෂික ඇසළ පෙරහර හේතුවෙන් හැටන් කොළඹ ප්‍රධාන මාර්ගය රථවාහන ගමනා ගමනය සීමා කිරීම.

සීතාවකපුර කොට්ඨාසයේ යටියන්තොට පොලිස් වසමේ පිහිටි කබුළුමුල්ල රජමහා පත්තිණි දේවාලය මඟින් සංවිධානය කරනු ලබන වාර්ෂික ඇසල පෙරහර 2024.07.26 වන දින රාත්‍රී 08.00 සිට මධ්‍යම රාත්‍රී දක්වා වීථි සංචාරය කිරීම සඳහා නියමිතව ඇත.

පෙරහර යටියන්තොට කබුළුමුල්ල රජමහා පත්තිණි දේවාලයෙන් ආරම්භ කර හැටන් කොළඹ මාර්ගයේ කරවනැල්ල නගරය දක්වා ගමන් කර එතැන් සිට කෑගල්ල අවිස්සාවේලල මාර්ගයේ මීටර් 300ක් පමණ කෑගල්ල දෙසට ගමන් කිරීමෙන් පසු වැන්දල විහාරස්ථානය අසලින් නැවත පෙරහර ගමන්ගත් මාර්ගයේම ගමන් කර කබුළුමුල්ල දේවාලයට පැමිණීමට නියමිතව ඇත.

පෙරහර ගමන් ගන්නා කාලය තුල හැටන් කොළඹ ප්‍රධාන මාර්ගයේ ඇති විය හැකි රථ වාහන තදබදය අවම කර ගැනීම සඳහා එම මාර්ගය භාවිතා කරන රියදුරන් හා මහජනතාවට පහත විකල්ප මාර්ගයන් භාවිතා කරන ලෙස දැනුම් දෙනු ලබයි.

### විකල්ප මාර්ග

- හැටන් දෙස සිට අවිස්සාවේල්ල දෙසට ගමන් කරන වාහන සඳහා යටියන්තොට නවට හන්දියෙන් දකුණට ඇති පරුස්සැල්ල, පනාපිටිය මාර්ගයේ වරාවල හන්දිය දක්වා ගමන්කර වරාවල හන්දියෙන් වමට ඇති කෑගල්ල අවිස්සාවේල්ල ප්‍රධාන මාර්ගයේ කරවනැල්ල දක්වා ගමන් කර ප්‍රධාන මාර්ගයේ අවිස්සාවේල්ල දෙසට ගමන් කළ හැකිය.

- කොළඹ දෙස සිට හැටන් දෙසට ගමන් කරන වාහන සඳහා කරවනැල්ල හන්දියෙන් වමට ඇති කෑගල්ල අවිස්සාවේල්ල ප්‍රධාන මාර්ගයේ වරාවල හන්දියට ගමන් කර දකුණට බුලත්කොහුපිටිය මාර්ගයේ පනාපිටිය හන්දියෙන්

දකුණට හැරී හපුගම්මන, පරුස්සැල්ල මාර්ගයෙන් නවට හන්දිය දක්වා ගමන් කර ප්‍රධාන මාර්ගයට පිවිස වමට හැරී හැටන් දක්වා ගමන් කළ හැකිය.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**